**<u>ඉන්දියාවේ ඉතිහාසය - කාර්ය පත්‍රිකා 5</u>**

**<u>12 ශ්‍රේණිය - ඉතිහාසය</u>**

**<u>5 ඒකකය</u>**

## <u>දේශපාලන හා මානව චින්තාවලි වර්ධනය</u>

**නිපුණතාව - ඉන්දියා ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.**

**නිපුණතා මට්ටම 5.1 - සොලොස් මහා ජනපද ව්‍යාප්තිය පිළිබඳව විස්තර කරයි.**
**5.2 - ආගමික හා දාර්ශනික චින්තනය ඉන්දීය ශිෂ්ටාචාරයක් ගොඩ නැගීමට දායක වී ඇති ආකාරය විමර්ශනය කරයි.**

1.ක්‍රිස්තු පූර්ව හය වන සියවසේ උතුරු ඉන්දියාවේ දේශපාලන තත්ත්වය විස්තර කරන්න.

2.ක්‍රිස්තු පූර්ව හය වන සියවසේ ඉන්දියාවේ ක්‍රියාත්මක වූ පාලන ක්‍රම අතුරින් වඩාත් ප්‍රජාතන්ත්‍රීය පාලන ක්‍රමය සමූහාණ්ඩු ක්‍රමයයි.

1.සොලොස් මහා ජනපදවලට අයත් නොවූ ගණ රාජ්‍ය දෙකක් නම් කරන්න.
2.ගණ රාජ්‍යවල පාලන ක්‍රමයේ විශේෂතා පරීක්ෂා කරන්න.
3.ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේද?හේතු දක්වන්න.

3.සොලොස් මහා ජනපද අතුරින් බලවත් රාජ්‍ය ලෙස ඉස්මතු වූ රාජ්‍ය පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් කරන්න.

4.මගධයේ නැගීමට බිම්බිසාර අජාසත්ත රජුගේ දායකත්වය ප්‍රමාණය කරන්න.

5.පහත දැක්වෙන මාතෘකා කෙරෙහි අවධානය යොමු කරමින් මගධයේදී බලවත් වීමට තුඩු දුන් සාධක පිළිබඳව කෙටි විස්තරයක් ඉදිරිපත් කරන්න.

1.භූ භෞතික සාධක
2.දේශපාලන සාධක
3.ආර්ථික සාධක
4.සමාජීය සාධක

6.පහත සඳහන් ස්ථාන ඉන්දියාවේ සිතියමක ලකුණු කර දක්වන්න.

මගධය,අංග,පාඨලීපුත්‍ර,කාසි,කෝසලය,වත්ස,අවන්ති,යමුනා ගංගා,ගාන්ධාර,අස්මක,කාම්බෝජය

**නිපුණතා මට්ටම 5.2 - ආගමික හා දාර්ශනික චින්තනය ඉන්දීය ශිෂ්ටාචාරය ගොඩනැගීමට දායක වී ඇති ආකාරය විමර්ශනය කරයි.**

1.ක්‍රි.පූ.6 වන සියවසේ වර්ධනය වී පැවති ආගමික චින්තාවන් පිළිබඳව සංක්ෂිප්ත වූ කරුණු දක්වන්න.

2.ක්‍රි.පූ.6 වන සියවසේ දී පහළ වූ නව ආගමික සංකල්පයක් නිසා භාරතීය සමාජයේ සිදු වූ දේශපාලන හා සමාජීය වර්ධනයන් පිළිබඳ ඇගයීමක් කරන්න.

3.ක්‍රි.පූ.6 වන සියවසේ ඉන්දියාවේ ශිෂ්ටාචාරය හැඩ ගැන්වූ තීරණාත්මක බලවේගය බුදු දහමයි.

1.ක්‍රි.පූ.6 වන සියවසේදී බුදු දහමේ දියුණුවට ක්‍රියා කළ පාලකයින් දෙදෙනෙකු නම් කරන්න.

2.ක්‍රි.පූ.6 වන සියවසේ දී ඉන්දියාවේ පැවති බුදු දහමේ සංකල්පවලට සමීප ඉගැන්වීම් ඉදිරිපත් කළ නව ආගමික චින්තාවන් කෙටියෙන් හඳුන්වන්න.

3.ඉහත දැක්වෙන ප්‍රකාශය විචාරාත්මකව පරීක්ෂා කරන්න.

4.ක්‍රි.පූ.6 වන සියවසේ සමාජ තත්ත්වය හැඩ ගැසීමට බ්‍රාහ්මණ ඉගැන්වීම් බලපෑ ආකාරය විමසීමක් කරන්න.

5.ක්‍රි.පූ.6 වන සියවසේ දී ෂඩ් ශාස්තෘවරුන් ඉදිරිපත් කළ දර්ශනයන් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

**සැකසුම - කුසුම් උපතිස්ස මිය,**

**ර/ජේසු බිළින්දාගේ කන්‍යාරාම ජාතික පාසල.**